**රිදීගම ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රිදීගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර්, දෙසැම්බර් මාසවලට අදාළව ගෙවියයුතු ඉන්ධන වියදම් රු.269,471 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සේවක ණය අයවීම් රු.68,750 ක් ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබියයුතු ගිණුම්

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.64,910,697 ක් වූ ලැබියයුතු ශේෂවලින් රු.7,592,632 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.43,843,359 ක් වූ ගෙවියයුතු ශේෂවලින් රු.7,771,534 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.10,972,082 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 570 හා 571 | 125,000 | හිමිකම් නොපෑ තැන්පත් 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 715 (2) | 709,380 | විවිධ වර්ගවලට අයත් ද්‍රව්‍ය තොග ප්‍රයෝජනයට ගැනීමකින් තොරව වර්ෂ ගණනාවක සිට ගබඩාවේ තබා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 750 | - | සභාව සතු මෝටර් රථ ඇතුළු සභා වාහනවල රාජ්‍ය ලාංජනය මුද්‍රා කර නොතිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| 3:4:2 (අ) මාර්ගෝපදේශය | 977,320 | 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ සිදුකර තිබුණු මිලදී ගැනීම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව සිදුකර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,727,479 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,591,345 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 3,083 | 3,777 | 3,358 | 2,904 | 2,565 | 2,478 | 2,791 | 2,485 |
| (ii) බදු කුලී | 4,917 | 5,635 | 5,466 | 553 | 4,487 | 4,694 | 4,765 | 385 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,683 | 1,612 | 1,718 | 171 | 1,182 | 1,612 | 1,704 | 276 |
| (iv) වෙනත් ආදායම් | 77,322 | 69,535 | 69,531 | 37,390 | 75,453 | 67,095 | 54,593 | 37,382 |
| එකතුව | 87,005 | 80,559 | 80,073 | 41,018 | 83,687 | 75,879 | 63,853 | 40,528 |

සටහන

සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඉකුත් වර්ෂයන්ට අදාළව අයකළ රුපියල් මිලියන 29 ක් ඇතුළත්ව තිබුණි.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

--------------------------------------

රුපියල් මිලියන 87 ක් වූ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමින් රුපියල් මිලියන 80 ක් බිල්කර ඉකුත් වර්ෂවල රුපියල් මිලියන 29 ක් වූ හිඟ ලැබීම් සමග රුපියල් මිලියන 80 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 40 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 41 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟය හා වර්ෂයේ බිල් කිරීම් සමග එකතුව රු.5,460,127 ක් වූ රැස්කළ යුතු වරිපනම් ආදායමින් රු.2,750,037 ක් හෙවත් සියයට 50 ක් පමණක් රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,656,075 ක් අයකරගත යුතුව තිබුණි.

(ආ) අක්කර බදු

-------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.240,204 ක් වූ හිඟ අක්කර බදුවලින් වර්ෂය තුළදී සියයට 7 කට සමානව රු.17,034 ක් පමණක් අයවී තිබූ අතර සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.248,359 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

**2.2.4 බදු කුලී හා කඩ කුලී**

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වත්කම් බදුදීමට අදාළව අයවියයුතු රු.307,915 ක් වූ බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රිදීගම පොදු වෙළඳපල කඩ කාමරවලට අදාලව 1988 සහ 2013 වර්ෂවල සිට රු.48,360 ක් අයකර ගැනීමට තිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

--------------

පසුගිය වර්ෂවලට අදාළව පැවති රු.170,935 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.2,573,753 ක් හා මුද්දර ගාස්තු රු.24,715,895 ක් අයකරගත යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට කාරණා 14 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මාසිකව එකතු කරනු ලබන කසළ ටොන් 75 කින් නොදිරන කසළ ටොන් 30 ක් පමණ බදු පදනම මත ලබාගෙන තිබුණු පුද්ගලික ඉඩමක වළවල් කපා බැහැර කිරීම තුළ අනාගතයේදී පාරිසරික ගැටළු නිර්මාණය විය හැකිව තිබුණි.

(ii) ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය තුළ පොලිතීන් කිලෝ ග්‍රෑම් 450 ක් පමණ එකතු වී තිබුණු අතර, ඒවා සුදුසු පරිදි ඉවත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

"තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව පුළුල් දැනුමක් සභාව සතු නොවූ නමුත් දිළිඳුකම පිටු දැකීමට ස්වයංරැකියා සඳහා අවශ්‍ය ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. ආදායම් මට්ටම් ස්ථාවර නොවීම, ජීවන වියදම ඉහළ යාම වැනි හේතූන් මත තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වර්ෂ කිහිපය තුළ වරිපනම් හිඟ ශේෂය රු.2,656,075 ක් දක්වා වර්ධනය වෙමින් පැවතියද ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) සහ (ඇ) පරිදි දේපල තහනම් වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කර රු.189,886 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ අයකරගෙන තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී රු.12,379,634 ක් වැයකර ඉදිකර තිබුණු කඩ කාමර 16 කින් කඩ කාමර 11 ක් බද්දට හෝ කුලියට දීමට සභාව කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

අක්කර 60 ක් පමණ වූ ඉඩමක් සභාවේ අවසරයකින් තොරව වර්ෂ කිහිපයකට පෙර වෙන්දේසි කර තිබුණු අතර, විකුණුම් වටිනාකමින් සභාවට අයවියයුතු සියයට 01 ක බදු මුදල සහ පොදු කටයුතු සඳහා වූ ඉඩම් කොටස් සභාවට අහිමි වී තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

-----------------------------

**3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

---------------------------------------------

වාහන ගාල් කිරීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ඉදිකර වත්කම්වල ආරක්ෂාව සහ පැවැත්ම වෙනුවෙන් කටයුතු කර නොතිබුණි.

**3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

------------------------------------------

සභාවට අයත් සුසාන භූමි 53 කින් 41 ක් වර්ෂ ගණනාවක සිට සංවර්ධනය කිරීමට හෝ නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

-----------------

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

-------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් වර්ෂ ගණනාවක සිට පිළියෙල කර නොතිබුණි.

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

අනුමත සීමාව රු.1,662,000 කින් ඉක්මවා ප්‍රජාපාදක සංවිධාන දෙකකට කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර, එම සමිතිවල මූල්‍යමය හැකියාව පිළිබඳ සනාථ කරගෙන නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ආදායම් පරිපාලනය | හිඟ ශේෂ අයකර ගැනීම මන්දගාමී තත්ත්වයෙන් සිදු කිරීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | ඔප්පු හා පැවරුම් සහතික නොමැති ඉඩම් ගොඩනැගිලි හා සුසාන භූමි සඳහා ඔප්පු ලබාගෙන නොතිබීම. |
| (ඇ) කසළ කළමනාකරණය | කසළ අපහරණය සම්බන්ධයෙන් දීර්ඝ කාලීන ක්‍රියාමාර්ග හඳුනාගෙන නොමැති වීම. |